**කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2018**

---

කැළණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය අතර 2014 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී - III දරන ණය ගිවිසුමේ විධිවිධානයන් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග, මාර්ග සංවර්ධන සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහල සංචලතා සම්බන්ධකයක් ලෙස කැළණි ගඟ ඉහලින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය මඟින් වාහන තදබදය අවම කිරීම හා විසුරුවා හැරීම මෙන්ම එමඟින් කොළඹ නගරයේ ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම හා ආර්ථික සංවර්ධනය දිරිගැන්වීම සඳහා දායකවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වටිනාකම රු.මිලියන 55,313 කට සමාන ජපන් යෙන් මිලියන 41,429 ක් වන අතර ඉන් රු.මිලියන 46,755 කට සමාන ජපන් යෙන් මිලියන 35,020 ක් ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් ලබා දීමට එකඟ වී තිබුණි. ඉතිරි රු. මිලියන 8,558 ක වටිනාකම ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සැපයීමට නියමිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජූලි 01 නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වා ගණනය කළ මතය.

මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණනය ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි. ව්‍යාපෘතිය මඟින් වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණන කාලය තුළදී හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලනයේ වැදගත් අකාර්යක්ෂමතා ඇතුළුව අනෙකුත් කරුණු අතරින් වැදගත් විගණන සොයාගැනීම්, සම්බන්ධ පාර්ශවයන් සමඟ සන්නිවේදනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම.**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | **ගිණුම්කරණ අඩුපාඩු** | **බලපෑම** | **කළමනාකරණ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් වැඩ වල නියුතු කොන්ත්‍රාත්කරුවන්ට 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 58.97 ගිණුමට ගෙන නොතිබුණි. | කෙරීගෙන යන වැඩ වටිනාකම සහ ජංගම වගකීම් අඩුවෙන් පෙන්නුම් කරයි. | පෙර වර්ෂයට අදාළ වියදම් එකතුකර උපචිත වියදම් ලෙස සලකා තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු අගය මත වෙන් කිරීම් සිදු කිරීම් අවශ්‍ය වේ. |
| (ආ) | අවතැන් වූ පුද්ගලයින් සඳහා නවාතැන් දීමේ අරමුණින් ව්‍යාපෘතිය මඟින් ප්‍රසම්පාදනය කරන ලද ගොඩනැගිල්ල 2017 අප්‍රේල් 17 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණද, එය කෙරීගෙන යන වැඩ යටතේ අඛණ්ඩව පෙන්වා තිබුණි. | කෙරීගෙන යන වැඩ වටිනාකම සහ ජංගම වගකීම් අඩුවෙන් පෙන්නුම් කරයි. | අවතැන් වූ පාර්ශවයන් ප්‍රතිස්ථාපනය කිරීම ව්‍යාපෘතියේ කාර්යයක් ලෙස සලකන අතර වත්කම් මාර්ග සංවර්ධන අධිකාරියට භාරදෙන තෙක් කෙරීගෙන යන වැඩ යටතේ පෙන්නුම් කරන ලදී. | වත්කමේ ජීවිත කාලය පදනම්ව එය වෙනම වත්කමක් ලෙස හඳුනාගැනීම අවශ්‍ය වේ. |

**3. භෞතික කාර්යසාධනය.**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය.**

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) Extra - Dosed Bridge Section හා Steel Bridge Section කොටසට අදාළව කොන්ත්‍රාත් 02 ක් යටතේ සිදුවන කොළඹ වරායට කණුමතින් දිවෙන මාර්ගය සහ හුවමාරු මංතීරු 06 ක් සහිතව කැළණි ගඟ ඉහළින් පවතින පාලමට යාබදව නව පාලමේ ඉදිකිරීමේ කාර්යයන් 2017 අවසාන කාර්තුවේ ආරම්භ වී වර්ෂ 03 කින් නිමකිරීමට සැලසුම් කර තිබුණි. ලැබී ඇති තොරතුරු වලට අනුව 2018 දෙසැම්බර් 31 දින වන විට ළඟා කරගත යුතු අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 38.35 සහ සියයට 11.16 ට එරෙහිව එම දිනට භෞතික ප්‍රගතිය සියයට 31.14 සහ සියයට 10.07 ක් ළඟා කරගෙන තිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරිය හා ලංකා විදුලිබල මණ්ඩලය අතර රු. මිලියන 1240 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2014 මාර්තු 27 දින ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව විදුලි සම්ප්‍රේෂන මාර්ග භූගත රැහැන් වලට පරිවර්තනය කිරීම 2016 දෙසැම්බර් 31 දින වන විට අවසන් කළ යුතුව තිබුණි. කෙසේ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විට වසර 02 ක් ගත වී තිබිය දීත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය.

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) අධිබැලැති ගුවන් සම්ප්‍රේෂන මාර්ග පරිවර්තනය කිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ තෝරාගත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් ඇප බැඳුම්කරය 2018 අගෝස්තු 17 දින කල් ඉකුත් වී තිබූ අතර එම ඇපකරවල කාලය දීර්ඝ කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | හිඟ මුදල් අයකර ගැනීමේ අවධානම. | අළුත් කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ඇප බැඳුම්කරවල කාලය දීර්ඝ කිරීමට වහාම කටයුතු කළ යුතුය. |
| (ආ) කොළඹ - කටුනායක අධිවේගී මාර්ගයේ විවිධ වාහන ධාවනය සඳහා තාවකාලිකව ඉදිකරන ලද මාර්ගය, සැලසුම්කරන අදියරේ දී හඳුනාගෙන නොතිබුණු අතර ඒ සඳහා අමතර පිරිවැය රු.මිලියන 463 ක් දැරීමට සිදු වී තිබුණි. | පාළම ඉදිකිරීමේ දී ඇතිවන අමතර පිරිවැය. | අදහස් දක්වා නොමැත. | අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා සියලුම විකල්ප විමර්ශනය කළ යුතුය. |

### 3.3 බාහිර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| අත්පත් කර ගත් රු.මිලියන 06 ක් පිරිවැයති නිවාස 03 ක් අවතැන් වූ ජනතාව පදිංචි කරවීම වෙනුවෙන් ප්‍රසම්පාදනය කර තිබුණු අතර ඒවා බලාපොරොත්තු අරමුණු සඳහා යෙදවීමෙන් තොරව කාර්යාලීය අවශ්‍යතා සඳහා භාවිතා කර තිබුණි. | බලාපොරොත්තු වූ අරමුණ ළඟා කරගෙන නොමැත. | අනුමත ප්‍රතිස්ථාපන සැලැස්මේ දැක්වෙන ප්‍රතිස්ථාපන කාර්යයන් හේතුවෙන් පැන නගිමින් පවතින දුක් ගැනවිලි සහන කටයුතු වලට අදාළ අනෙකුත් මෙහෙයුම් අවශ්‍යතා සඳහා සහ කාර්යාලය සඳහා දැනට පවතින නිවාස 03 භාවිතා කරන ලදී | අදාළ අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට ව්‍යාපෘති ඉංජිනේරුවරයෙකු ප්‍රමාණ සමීක්ෂකයකු සහ වැඩබිම් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරින් 04 දෙනෙකු වශයෙන් ප්‍රධාන කළමනාකරණ හා මෙහෙයුම් තනතුරු පුරප්පාඩු වී පැවති බව නිරීක්ෂණය විය.